සැ. යු. - 2013.04.12 දින පළ වූ අංක 1806 දරන ගැසට් පත්‍රයේ I-III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,807 - 2013 අප්‍රේල් 19 වැනි සිකුරාදා - 2013.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1058 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1070 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | –– |

*සැ. යු.-* (i) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කොටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1057 - B 80722— 6,950 (2013/04)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

### තනතුරු පුරප්පාඩු

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව තුළ දැනට පුරප්පාඩු පවතින පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා දැනටමත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ කවර හෝ ආකාරයක සේවා නියුක්තියක යෙදී සිටින අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* (මාසික) | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | රියදුරු III වැනි පන්තිය | 11 | PL3-2006A<br>රු. 12,470 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170- රු. 18,860<br>හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) රජය අනුමත කළ පාසලකින් අවම වශයෙන් 08 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී සිටිය යුතු ය.<br>(ii) පෞද්ගලික කුළී රථ සහකාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය.<br>(iii) වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබිය යුතු ය.<br>(iv) අවම උස අඩි 05 ක් විය යුතු ය.<br>(v) දිවා සහ රාත්‍රී කාලවල සේවයේ යෙදී සිටීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>(vi) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු ය.<br>(vii) පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සහ මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු අතර, ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. |
| 02. | යන්ත්‍ර ක්‍රියාකරු<br>(i) රෝඩ් රෝලර් රියදුරු/ගල් රෝල් රියදුරු/ පාර තලන යන්ත්‍ර ක්‍රියාකරු<br><br>(ii) බැකෝ ලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරු.<br><br>(iii) එස්කැවේටර් යන්ත්‍ර ක්‍රියාකරු<br><br>(iv) ස්කිඩ් ස්ටියර් යන්ත්‍ර ක්‍රියාකරු | 02<br><br>01<br><br>02<br><br>03 | PL3-2006A<br>රු.12,470- 10 x 130 - 10 x 145-10 x 160- 12 x 170 - රු. 18,860<br>හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් :*<br>(i) අවම වශයෙන් 08 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබීම.<br><br>*බාහිර අයදුම්කරුවන් :*<br>(ii) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02 ක් සමත් වී තිබීම.<br><br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*<br>*(අ)* තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බල ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>*(ආ)* අවම උස අඩි 05යි අඟල් 06 ක් විය යුතු ය.<br>*(ඇ)* බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම.<br>*(ඈ)* මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතු ය. |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03 | ආදාහනාගාර ක්‍රියාකරු | 04 | PL2-2006A<br>රු.12,210- 10 x 130 - 10 x145-10 x 160 - 12 x 170- රු.18,600<br>හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | *අභ්‍යන්තර අයදුම්කරුවන් ඃ*<br>(අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම;<br>සහ<br>(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා /ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කළ යුතුය.)<br>*බාහිර අයදුම්කරුවන් ඃ*<br>(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම;<br>සහ<br>(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 04 | PL1-2006A<br>රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160-රු.17,600<br>හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබීම. |
| 05. | වෙළඳසැල් පරිපාලක II ශ්‍රේණිය | 01 | MN1<br>රු.12,470- 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 - රු.18,860<br>හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | (අ) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතු ය)<br>සහ<br>(ආ) මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර සිංහල හා දෙමළ භාෂාවලින් කතා කිරීමට හැකියාව තිබිය යුතුය. |
| 06 | සෞඛ්‍ය පරිපාලක II ශ්‍රේණිය | 15 | MN<br>රු.13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320- රු.22,040<br>හතරවැනි වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/ වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/ සෞඛ්‍ය විද්‍යාව/ විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 5කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම ;<br>හෝ<br>(ආ) සිංහල/දෙමළ, ගණිතය/අංක ගණිතය/ වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු ;<br>හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි පන්තිය සාමාර්ථය ලබා තිබීම. |

| අනු අංකය | තනතුර නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 07 | ගිනිබට | 12 | RS1- රු.14,280 -7 x 145 - 10 x 180 - 17 x 240 - රු.21,175 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | (අ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් අඩු වශයෙන් වාර 02 ක දී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව, ඇතුළු විෂයයන් 06 කින් සමත්වී තිබිය යුතු අතර ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවකදී සමත් වී තිබිය යුතු ය.<br>(ආ) අඩි 05 අඟල් 04 ක අවම උසකින් යුක්ත විය යුතු ය.<br>(ඇ) රාත්තල් 125 ක අවම බරකින් යුක්ත විය යුතුය.<br>(ඈ) අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය. |
| 08 | ක්‍රීඩා භූමි උපදේශක III ශ්‍රේණිය | 01 | PL3-2006A රු.12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) කාන්තාවන් සඳහා අවම උස අඩි 4 යි අඟල් 10 ක් විය යුතු ය. පිරිමින් සඳහා අවම උස අඩි 05යි අඟල් 02 ට විය යුතු ය.<br>*සහ*<br>(ii) ජ්‍යෙෂ්ඨ පාඨමාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා. පෙළ), විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ ගණිතය/වාණිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. මෙම විෂයන් අතරින් එක් වතාවකදී විෂයයන් 05 ක් එකවර සමත්ව තිබිය යුතු ය.<br>*හෝ*<br>(iii) ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br>*සහ*<br>(iv) ක්‍රීඩා සංවිධානය කිරීමේ හා ප්‍රමුඛත්වය ගැනීමේ හැකියාවක් තිබිය යුතු ය.<br>(v) ඉහත සුදුසුකම් වලට අමතරව ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලදී, සමස්ථ ලංකා මට්ටමේ ක්‍රීඩා තරග වලදී පළමුවෙනි ශ්‍රේණියේ අන්තර් සාමාජීය මට්ටමේ ක්‍රීඩා තරගවලදී, දස්කම් දක්වා ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.<br>(දස්කම් දැක්වීම යනුවෙන් අදහස් කරන්නේ ජාත්‍යන්තර සහ සමස්ථ ලංකා මට්ටමේ තරගවලට සහභාගී වී තිබීම සහ අන්තර් සමාජීය මට්ටමේ තරගවලදී පළමුවන, දෙවන හෝ තෙවන ස්ථාන ලබා තිබීම වේ.) |
| 09 | වාහන පින්තාරුකරු (Vehicle Painter) | 02 | PL2-2006A රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,600 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 මට්ටමේ සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ*<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ* |
| 10 | බෙලෙක්කරු (Tinker) | 01 | | |

| අනු. අංකය | තනතුර නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව, එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |
| 11 | සුසාන භූමි භාරකරු (කාර්යාල සේවක සේවක සේවය II) | 01 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 145 - 12 x 160 - රු.17,600 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී, එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් ව තිබිය යුතුවේ. |
| 12 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 75 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය (09 වසර ) සමත් වී තිබීම. |
| 13 | සෞඛ්‍ය කම්කරු | 100 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*01. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට මේ උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත අයෙකු විය යුතු ය.

(v) ඉහත පළමුවැනි ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදාළව එය ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(vi) සේවා අවශ්‍යතාව අනුව සහ අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහි දී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(vii) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මේ නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීමේ බලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

*02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) අදාළ පරිදි වැන්දඹු සහ අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) බඳවා ගනු ලබන තැනැත්තන් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

(iv) මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය, රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් හා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

*03. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය.*

මේ නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව, 8.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක (අංක 1 සිට 2.3 දක්වා එක් පැත්තකද අංක 3 සිට ඉදිරියට අනෙක් පැත්තේද වන සේ කඩදාසිය දෙපැත්තේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2013.05.20 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. දැනටමත් හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුනු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුරක් සඳහා වන අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායාස්ථිත පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික,

*(ඇ)* පළපුරුද්ද පිළිබඳ සහතික,

*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,

*(ඉ)* ජාතික හැඳුනුම්පත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත,

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස දෙකකට නොඅඩු කාලයක් තුළ ලබා ගත් එකක් විය යුතුය.)

*04. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා ක්‍රමය*

කිසියම් තනතුරක් සඳහා අවශ්‍ය අවම සුදුසුකම් පවතින බවට, ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතිකවලින් දක්වා ඇති සෑම අයදුම්කරුවෙක්ම සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකටද යොමු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබාගන්නා තැනැත්තන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනත්තා කවුරුන්ද යන්න දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළු කාරණා පිළිබඳ අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

කේ. බී. වී. ඩී. එන්. මුතුගල,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2013 අප්‍රේල් මස 02 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ දී ය.

04-585

## වලපනේ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

වලපනේ ප්‍රාදේශීය සභාවේ පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II ශ්‍රේණිය | 02 | PL 3-2006 A රු. 12,470 - 10x130 - 10 x 145 - 10 x 160- 12 x 170 - රු. 18,860 | *(1) අධ්‍යාපන සුදුසුකම් .-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br>2. තනතුර සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල පානු නොලැබේ.)<br>3. වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතික මගින් සනාථ කළ යුතුය)<br>4. අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතුය. |
| 02 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | PL 1-2006A රු. 11,730 - 18x120 - රු. 13,390 | *(2) අධ්‍යාපන සුදුසුකම්.-*<br>දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br>2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට වැඩිවිය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |

| අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 03 | විදුලි කාර්මික | 01 | (PL 2-6/2006A) රු. 12,210 - 10x130 - 10 x 145 - 10 x 160- 12 x 170 - රු.18,600 | *(3) අධ්‍යාපන සුදුසුකම්.-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයාන පොදු සහතික පත්‍ර(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය<br>2. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 04 | ආදාහනාගාර සහායක | 01 | (PL 1-6/2006A) රු. 11,730- 18x120 - රු. 13,830 | *(4) අධ්‍යාපන සුදුසුකම්.-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයාපන පොදු සහතික පත්‍ර(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය<br>2. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 05 | ආදාහනාගාර ක්‍රියාකාරු | 01 | (PL 2-6/2006A) රු. 12,210 - 10x130 - 10 x 145 - 10 x 160- 12 x 170 - රු. 18,600 | *(5) අධ්‍යාපන සුදුසුකම්.-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයාපන පොදු සහතික පත්‍ර(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය |

| *අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | 2. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 06 | මුරකරු | 02 | (PL 1-6/2006A) රු. 11,730 - 18x120 - රු. 13,830 | *අධ්‍යාපන සුදුසුකම්.-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයාපන පොදු සහතික පත්‍ර(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය<br>2. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. |
| 07 | ජල පොම්ප හරකරු | 01 | (PL 1-6/2006A) රු. 11,730 - 18x120 රු. 13,830 | *අධ්‍යාපන සුදුසුකම්.-*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයාපන පොදු සහතික පත්‍ර(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාපෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>*පොදු සුදුසුකම් .-*<br>1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br>2. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.<br>සටහන .- ඉහත තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතුරින් සුදුස්සන් ප්‍රමාණවත් නොවුණහොත් යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අයදුම්කරුවන්ගෙන් සුදුස්සන් තෝරා ගනු ලැබේ. |

03.1 *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි .-*

(01) අයදුම්කරු/කාරිය පරම්පාරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.

(02) අයදුම්කරු/කාරිය වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

(03) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(04) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(05) රජයේ හෝ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

(06) වලපනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයින්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(07) අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

3.2 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(2) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
(3) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.
(4) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට සහ මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාත් සභාවේ/මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා වලපනේ ප්‍රාදේශීය සභාව වරින්වර නිකුත් කරනු ලබන පළාතේ රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය .-*

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12x 8 ප්‍රමාණයේ) අයදුම්පත් සකස් කර ඉල්ලුම්කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2013.05.15 වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, වලපනේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතු ය) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු වන අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ණයේ දී ඉදිරිපත් කළ යුතුය.

* උප්පැන්න සහතිකය ;
* අධ්‍යාපන සහතිකය ;
* තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය ;
* මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02ක්, එකක් ග්‍රාම සේවා නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතු ය ;
* පළපුරුද්ද පිළිබඳ සහතික තිබේනම් එම සහතික (රජයේ/පළාත් පාලන) ;

3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

4. *බඳවා ගන්නා ක්‍රමය .-* අයදුම්කරුවන් අතුරින් නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ අවලංගු කිරීමේ බලතල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඒ. බී. කරුණාවතී,
ලේකම්,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 28 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**වලපනේ ප්‍රාදේශීය සභාව**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ..................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :————————————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————————.
02. ස්ථිර ලිපිනය:————————————.
    ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ————————————.
03. උපන් දිනය : ——————.
    2013.05.15 දිනට වයස : අවු.:——— මාස:——— දින:———
04. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.
05. අධ්‍යාපන සුදුසුකම්:————————————.
06. පළපුරුද්ද :————————————.
07. වෘත්තීය සුදුසුකම්:————————————.
08. වෙනත් සුදුසුකම්:————————————.
09. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේද? :————————————.

10. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමටත් බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව හොඳාකාරවම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .......................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————.
තනතුර :————————————.
දිනය :————————————.

04-560

---

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ ප්‍රාථමික (ශිල්පීය නොවන) තනතුරු පුරප්පාඩු

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | විදුලි කාර්මික | 01 |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 |
| 03. | පුස්තකාල සහායක | 03 |
| 04. | සෞඛ්‍ය කම්කරු | 04 |
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 |
| 06. | ආදාහනාගාර සහායක | 01 |

මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් ලබන්නා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

02. *වැටුප් ක්‍රමය* .- රු. 11,730 - 10x120 - 10 x 130 - 10 x 145 - 12 x 160 = රු. 17,600

03. *පොදු සුදුසුකම් :*

- (i) අයදුම්කරුවන් පරම්පරාවෙන්/ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
- (ii) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
- (iii) අවම වශයෙන් වර්ෂ 03ක් පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- (iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

04. *අධ්‍යාපන සුදුසුකම් :*

- I. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

- II. සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පමණක් අට (08) වැනි ශ්‍රේණිය (නව 09) වැනි වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් සේ සැලකේ.

05. *විදුලි කාර්මික තනතුර සඳහා ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :*

- *(අ)* විදුලි කාර්මික වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතික ලබා තිබීම ;හෝ
- *(ආ)* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) විදුලි කාර්මික වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ
- *(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) විදුලි කාර්මික වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ
- *(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) විදුලි කාර්මික වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ
- *(ඉ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) විදුලි කාර්මික වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ
- *(ඊ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක විදුලි කාර්මික වෘත්තියට අදාළ එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතික ලබා තිබීම ;
- *(උ)* "ඒ" ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා දීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

06. *විදුලි කාර්මික හා ආදාහනාගාර ක්‍රියාකරු තනතුර සඳහා පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ඇතුලත් සහතිකය ඉදිරිපත් කළ යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය .-*

- (i). බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.
- (ii). සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත සුදුස්සන් තෝරාගනු ලැබේ.
- (iii). පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් සේවකයින් සඳහා ප්‍රමුඛතාව හිමිවේ.

08. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගත් අයදුම්පත් "ලේකම්, පූජාපිටිය ප්‍රාදේශීය සභාව, පූජාපිටිය" යන ලිපිනයට 2013.05.22 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ ඉල්ලුම්කරන තනතුරට පැහැදිළිව සඳහන් කළ යුතුය. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් ගේ සහතිකය ;
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක් (මින් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.) ;
5. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

මෙම තනතුරු පුරප්පාඩු සියල්ලම හෝ කිහිපයක් සඳහා බඳවා ගැනීම,බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලය පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුවේ.

එම්. බී. එගොඩගෙදර,
ලේකම්,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.
පූජාපිටිය

2013 මාර්තු මස 14 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ..........................................තනතුරට බඳවා ගැනීම**

01. අයදුම්කරුගේ මුල් අකුරු සමග නම :—————.
    මුල් අකුරුවලින් හැඳින්වෙන නම් : —————.
02. ස්ථිර පදිංචි ලිපිනය:—————.
03. උපන් දිනය ඃ
    වර්ෂය:————. මාසය:—————. දිනය:—————.
04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස
    අවුරුදු :—————. මාස:—————. දින:—————.
05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? :—————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:—————.
07. අධ්‍යාපන සුදුසුකම්:—————.
08. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටී නම්, එම සේවා කාලය හා විස්තර (සේවා සහතිකයන් අමුණන්න) :———.
09. වෙනත් සුදුසුකම්:—————.

(ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා සහ පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් අමුණන්න)

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

—————.
අයදුම්කරුගේ අත්සන.

දිනය : —————.

04-504

---

**ජා-ඇල ප්‍රාදේශීය සභාව**

2013.03.22 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* IV ආ කොටසේ ජා - ඇල ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධ *ගැසට්* නිවේදනයේ සංශෝධනය

*ගැසට් නිවේදනයේ* අංක 02 යටතේ රියදුරු 11 ආ තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් ඃ
2013.03.22 දිනැති *ගැසට් පත්‍රයේ* පළවී තිබූ සුදුසුකම්වලට අමතරව පහත සුදුසුකම් ද ඇතුලත් විය යුතු යඃ-
වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.
අවම උස අඩි 05ක් විය යුතුය.
දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

එසේම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.04.26.

එල්. ඒ. මංජුලා සමන්ති,
ලේකම්,
ජාඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

04-592

# පළාත් පාලන නිවේදන

## පානදුර නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය අනුව කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වන වගන්තිය යටතේ පළාත් සභා IV(අ) වන කොටස යටතේ 2012.11.09 දින අංක 1783/39 දරන අති විශේෂ *ගැසට් නිවේදනය* ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 157(14අ) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තියෙන් පානදුර නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී නගර සභාව විසින් සාදනු ලැබ, පළාත් සභා නිවේදන IV(අ) වන කොටස යටතේ 1783/39 දරන අති විශේෂ *ගැසට් නිවේදනය* 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වන වගන්තිය ප්‍රකාරව 2011.11.29 වැනි දින පානදුර නගර සභාවේ පැවති මාසික සභා රැස්වීමේ තීරණ අංක 4.1 දරන යෝජනාවෙන් සම්මත වූ පරිදි බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළෙඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමා විසින් 2012.11.07 දින කරන ලද නිවේදනය පරිදි පළ කළ යුතු යෝජනා 2013.03.19 දින පානදුර නගර සභාවේ විශේෂ මහ සභාවේ ශීර්ෂ අංක 3 යටතේ අනු අංක 3.1 - 3.8 දරන යෝජනා ඒකමතිකව සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඩී. නන්දන ගුණතිලක,<br>
සභාපති,<br>
පානදුර නගර සභාව.

2013 අප්‍රේල් මස 02 වැනි දින,<br>
පානදුර නගර සභා කාර්යාලයේ දී ය.

ඉහත කී අනු අංක 3.1 - 3.8 දරන යෝජනා

1. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් 2013.05.01 දින සිට ක්‍රියාත්මක වේ.

2. පානදුර නගර සීමාව තුල ත්‍රීරෝදරථ නවතා තැබිය යුතු ස්ථාන (4 වන උපලේඛනය අනුව).

3. ත්‍රීරෝදරථ නවතා තැබිය හැකි ස්ථානවල නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝදරථ ගණන (4 වන උපලේඛනය අනුව).

4. අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛනයේ සඳහන් බලපත්‍රය නිකුත් කිරීම සඳහා පහත සඳහන් ගාස්තු නගර සභාවට ගෙවිය යුතුය. :–

   4.1 දැනට පවතින ත්‍රීරෝදරථ පළමුව ලියාපදිංචිය සඳහා එකවර ගෙවන මූලික ගාස්තුව රු. 1,000 කි. ;
   4.2 සෑම ත්‍රීරෝද රථයක් සඳහාම වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 1,800 කි.

5. බලපත්‍ර ගාස්තුව වාර්ෂිකව අයකරනු ලැබේ.

6. පානදුර නගර සීමාව තුළ 4 වන උපලේඛනය අනුව සම්මත වන ත්‍රීරෝදරථ නැවතුම්පළවල් ලැයිස්තුවට ඇතුළත් වන පහත සඳහන් නැවතුම් පළවල් විශේෂ නැවතුම්පළවල් ලෙස තීරණය කරමි:–

   6.1 හිරණ පාර මුල රථගාල ;
   6.2 මාර්ගස්ථ මගී ප්‍රවාහන බස් නැවතුම් පළ අසල හොරණ පාරට මුහුණ ලා ඇති රථගාල ;
   6.3 ජනප්‍රිය මාවත නැගෙනහිර පැත්ත රථගාල ;
   6.4 හත්වන හරස් වීදිය නැගෙනහිර රථගාල ;
   6.5 වලාන වටරවුම අසල සෝම හිමිගේ පිළිමය පිටුපස රථගාල ;
   6.6 පුද්ගලික බස් නැවතුම්පළ අසල පිහිටි ඉඩමේ ජනිත් ජයසල ගොඩනැගිල්ලේ උතුරු මායිම අසල රථගාල ;
   6.7 ජයතිලක මාවත නැගෙනහිර පැත්ත රථගාල.

7. එකී විශේෂ නැවතුම් පළවල් හැර සියලු නැවතුම් පළවල් සතියේ සෑම දිනකම පෙ. ව. 6.00 - ප. ව. 20.00 දක්වා පමණක් බලාත්මක වේ.

8. විශේෂ ත්‍රීරෝදරථ නැවතුම්පළවල් සඳහා පෙ. ව. 6.00 - ප. ව. 7.59 දක්වාත් ප. ව. 8.00 - පසුදින අලුයම 5.59 දක්වාත් ලෙස ජනතාවගේ අවශ්‍යතාව මත රථගාල් දිවා හා රාත්‍රී රථගාල් දෙකක් ලෙස පවත්වාගෙන යා යුතු ය.

4 වන උපලේඛනය

| *අනු. අංකය* | *රථගාලේ නම* | *පිහිටීම* | *රථ ගණන* | *සංකේතය* |
|---|---|---|---|---|
| | | *මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග (RDA)* | | |
| 01 | ආතර් වී දියෙස් මාවත (වෙළෙඳපල ඉදිරිපිට) | කරවල කඩය අසල | 05 | AVM/34 |

| *අනු. අංකය* | *රථගාලේ නම* | *පිහිටීම* | *රථ ගණන* | *සංකේතය* |
|---|---|---|---|---|
| 02 | සාගර මාවත මුල (දකුනු පැත්ත) | ආතර් වී දියෙස් මාවත සිට අඩි 10 පස්සට | 05 | SAM/36 |
| 03 | ආතර් වී දියෙස් මාවත මුල (ප්‍රතිමාව අසල) | ගාලුපාරේ සිට අඩි 25 පස්සට (නැගෙනහිර) පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග (PRDA) | 03 | AVS/41 |
| 04 | ඉදිගහ පාර | ගාලුපාරේ සිට අඩි 25 පස්සට (උතුරු පැත්ත) | 08 | INR/02 |
| 05 | ඉදිගහ පාර හතරමං හන්දිය | ඉදිගහපාර සිට අඩි 25 - අධිනීතිඥ ලෙනින් ප්‍රනාන්දු මාවත (දකුණු පස) | 05 | LFM/03 |
| 06 | හිරණ පාර මුල | ගාලුපාරේ සිට අඩි 25 පස්සට (දකුණු පැත්ත) | 08 | HIR/07 |
| 07 | උඩහමුල්ල වංගුව (හිරණ පාර) | බුදුපිළිමය පිටුපස සිට කුලතුංග පාර | 03 | KUR/08 |
| 08 | මාලමුල්ල පාර මුල | හිරණපාරේ සිට අඩි 10 පස්සට (උතුරු පැත්ත) | 03 | MMR/10 |
| 09 | සුසන්ත මාවත මුල (නැගෙනහිර පැත්ත) | ගාලුපාරේ සිට අඩි 25 පස්සට (දකුණු පැත්ත) | 04 | SUM/14 |
| 10 | විජේසූරිය මාවත (කෝවිල වත්ත පාර) | ගාලුපාරේ සිට අඩි 25 පස්සට (දකුණු පැත්ත) | 02 | WSM/38 |
| 11 | නෙවිල් පෙරේරා මාවත මුල | ගාලුපාරේ සිට අඩි 15 පස්සට (දකුණු පැත්ත) | 03 | NPM/45 |
| 12 | මොරවින්න පාර දෙවැනි පටුමඟ (ඥානරතන පාර කේ. එස්. පී. නාමපුවරුව අසල පාර) | මොරවින්න පාරේ සිට අඩි 10 ක් (බටහිර පැත්ත) | 03 | MOR/46 |
| 13 | දුම්රිය ස්ථානය ඉදිරිපිට | (නැගෙනහිර පැත්ත) | 05 | CGR/50 |
| 14 | දුම්රියපළ පාර මුල (ගල්කන්ද හෝටලය අසල) | ආතර් වී දියෙස් මාවත සිට අඩි 25ක් පස්සට | 03 | RSR/52 |
| | | *නගර සභාවට අයත් මාර්ග* | | |
| 15 | ධම්මානන්ද පාර | ගාලුපාරේ සිට අඩි 15 පස්සට (උතුරු පැත්ත) | 02 | DHR/04 |
| 16 | මහානාම පාර (බටහිර පැත්ත) | ගාලුපාරේ සිට අඩි 10 පස්සට (දකුණු පැත්ත) | 05 | MRW/05 |
| 17 | මහානාම පාර (ස්වීට් හවුස් හන්දිය) මඩවිල්ගොඩ පන්සල පැත්ත | මහානාම පාරේ සිට අඩි 10ක් පස්සට (දකුණු පැත්ත) | 04 | SHJ/06 |
| 18 | ඉන්ද්‍රජෝති මාවත මුල | දුරකථන කණුව පිටුපස දකුණු පැත්ත | 04 | IJM/09 |
| 19 | අශෝක මාවත මුල | මාලමුල්ල පාරේ සිට අඩි 10ක් පස්සට (දකුණු පැත්ත) | 02 | ASM/11 |
| 20 | පාසල් මාවත මුල | මාලමුල්ල පාරේ සිට අඩි 10ක් පස්සට (බටහිර පැත්ත) | 10 | SCH/12 |
| 21 | මානෙල් මාවත මුල | මාලමුල්ල පාරේ සිට අඩි 10ක් පස්සට (නැගෙනහිර පැත්ත) | 05 | MAM/13 |
| 22 | ජයතිලක මාවත මුල (නගර සභා තාප්පය අසල) | රණතිසර නාමපුවරුව යට සිට (දකුණු පැත්ත) | 04 | JTW/15 |
| 23 | පොදු සේවා මාවත | ගාලුපාරේ සිට අඩි 10ක් පස්සට | 03 | PSM/01 |
| 24 | ජයතිලක මාවත නැගෙනහිර පැත්ත | ගාලුපාරේ සිට අඩි 15ක් පස්සට | 05 | JTE/16 |
| 25 | කේතුමතිය රෝහල ඉදිරිපිට (ශ්‍රී මහා විහාර පාර) | නැගෙනහිර පැත්ත | 04 | KEH/17 |
| 26 | ජනප්‍රිය මාවත (බටහිර පැත්ත) | බුදුපිළමය ළඟ සිට (දකුණු පැත්ත) | 10 | DSW/18 |
| 27 | ජනප්‍රිය මාවත (බජට්ෂොප් ඉදිරිපිට) | ජනප්‍රිය මාවත (දකුණු පැත්ත) | 03 | DSB/19 |
| 28 | ජනප්‍රිය මාවත වෙළෙඳපොළට හැරෙන හන්දිය | ජනප්‍රිය මාවත (දකුණු පැත්ත) | 05 | DSM/20 |

| *අනු. අංකය* | *රථගාලේ නම* | *පිහිටීම* | *රථ ගණන* | *සංකේතය* |
|---|---|---|---|---|
| 29 | ජනප්‍රිය මාවත නැගෙනහිර පැත්ත | සී. ටී. බී. බස්නැවතුම්පල අසළ (ඉන්ධන පිරවුම්හල ළඟ සිට) | 04 | DSE/21 |
| 30 | හත්වන හරස් වීදිය නැගෙනහිර දිසාව | පානදුර බාලිකා විද්‍යාල තාප්පය අසළ ගාලු පාරේ සිට අඩි 25ක් පස්සට (උතුර) | 05 | SCE/22 |
| 31 | නොයෙල් මෙන්ඩිස් මාවත මුල | හොරණ පාරේ සිට අඩි 15ක් පස්සට (බටහිර) | 03 | NMM/23 |
| 32 | කවිරාජ මාවත මුල | හොරණ පාරේ සිට අඩි 15ක් පස්සට (බටහිර) | 05 | KRM/24 |
| 33 | කල්දේරම්මඩුවත්ත පාර | හොරණ පාරේ සිට අඩි 15ක් පස්සට (බටහිර) | 05 | KMR/25 |
| 34 | ග්‍රේස් පීරිස් මාවත මුල | හොරණ පාරේ සිට අඩි 15ක් පස්සට (බටහිර) | 05 | GPE/26 |
| 35 | සුදුවැල්ල පාර මුල | හොරණ පාරේ සිට අඩි 10ක් පස්සට (නැගෙනහිර) | 03 | SWR/27 |
| 36 | වෝල්ටර් සල්ගාදුමාවත මුල | හොරණ පාරේ සිට අඩි 10ක් පස්සට නැගෙනහිර | 03 | WSM/28 |
| 37 | ලෙස්ලි ගුණවර්ධන මාවත | මස්කඩය ඉදිරිපිට (නැගෙනහිර) | 05 | LG1/29 |
| 38 | ලෙස්ලි ගුණවර්ධන මාවත | ධර්මශාලව පාර මුල (නැගෙනහිර) | 10 | LG2/30 |
| 39 | ලෙස්ලි ගුණවර්ධන මාවත මැද | (බටහිර පැත්ත) | 05 | LG3/31 |
| 40 | ලෙස්ලි ගුණවර්ධන මාවත | ජනප්‍රිය මාවත අසල (බටහිර) | 03 | LG4/32 |
| 41 | ධර්මශාලාව පාර | පාරේ බටහිර පැත්ත | 05 | DHR/33 |
| 42 | රන්කොත් විහාර මාවත බටහිර පැත්ත | ගාලු පාරේ සිට අඩි 25ක් පස්සට (දකුණු පැත්ත) | 06 | SCW/37 |
| 43 | නිර්මල මාවත මුල | ගාලු පාරේ සිට අඩි 10ක් පස්සට (දකුණු පැත්ත) | 07 | NIR/42 |
| 44 | සමුද්‍ර මාවත මුල | ගාලුපාරේ සිට අඩි 10ක් පස්සට (උතුර පැත්ත) | 06 | SMM/43 |
| 45 | ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාල පාර | ගාලුපාර සිට අඩි 10ක් පස්සට (දකුණු පැත්ත) | 05 | SSG/44 |
| 46 | කවිරාජ මාවත - මොරවින්න මංසන්ධිය | කවිරාජ මාවත බුදුපිළිමය පිටුපස සිට (බටහිර) | 03 | KRM/47 |
| 47 | ගල්වැටි මෝදර පාර | ගාලුපාරේ සිට අඩි 10ක් පස්සට (දකුණු පැත්ත) | 05 | GMR/48 |
| 48 | ගුණරතන පාර කෙලවර (රේල් ගේට්ටුව අසල) | දුම්රිය හරස් පාර ලඟ සිට අඩි 25ක් රන්කොත් විහාරය දෙසට (දකුණ) | 02 | GUW/49 |
| 49 | විවිධ සේවා සමුපකාරය ඉදිරිපිට - මඬකුඹුර | ගාලු පාරට මුහුණ ලා | 03 | MPC/40 |
| 50 | විවිධසේවා සමුපකාරය ඉදිරිපිට - මොදරවිල | ගාලු පාරට මුහුණ ලා | 03 | MPC/35 |
| 51 | පුද්ගලික බස්නැවතුම්පල ඉදිරිපිට | හොරණ පාර (දකුණ) | 08 | PBS/51 |
| 52 | පුද්ගලික බස්නැවතුම්පල අසල පිහිටි ඉඩමේ ජනිත් ගොඩනැගිල්ලේ උතුරු මායිම | ගාලු පාර නැගෙනහිර පැත්ත | 05 | PBS/39 |
| 53 | දිබ්බැද්ද පාර අසල රථගාල | දිබ්බැද්ද පාරේ සිට කොළඹ දෙසට මීටර 20ක් (නැගෙනහිර පැත්ත) | 03 | DRJ/53 |
| 54 | වලාන වටරවුම අසල | සෝමහිමිගේ පිළිමය පිටුපස | 03 | WRA/54 |

## පානදුර නගර සභාව

### ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු - 2013

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 හා 157 වැනි වගන්ති යටතේ පානදුර නගර සභාව විසින් වැළඳගත් 1975 සැප්තැම්බර් මස 12 වැනි දින අංක 181 දරන *ගැසට් පත්‍රයේ* පළකර ඇති පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ XXXII විස්තර කරන ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ව්‍යවස්ථාවේ (3)1 සඳහන් ගාස්තු සංශෝධනය කිරීමට 2013.03.19 දිනැති රැස්වීම් තීරණ අංක 07 යටතේ අනුමත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඩී. නන්දන ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

2013 අප්‍රේල් මස 02 වැනි දින,
පානදුර නගර සභා කාර්යාලයේදී ය.

**යෝජනාව**

සියලුම දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු. 100 ලෙස අයකිරීමට යෝජනා කරමි. (2012.12.14 දින අංක 1789 දරන *ගැසට් පත්‍රයේ* පළකර ඇති නිවේදනයේ ගාස්තු සංශෝධනය කිරීම)

***උපලේඛනය***

| *විස්තර* | *පෙර පැවති ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| 01. සියලුම දැන්වීම් පුවරු | වර්ග අඩියකට රු. 50 බැගින් | වර්ග අඩියකට රු. 100 බැගින් |

04-644/2

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝඝාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත්, නම ඉදිරියෙන් සඳහන් මස් වෙළඳසැලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2013 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවයක් දැක්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකුට ඔහුගේ/ඇයගේ විරෝධතාවය සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින දාහතරක් (දින 14ක් ) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. එම්. බන්දුල සෙනවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙළිඔය.

2013 මාර්තු මස 20 වැනි දින,
ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස් වෙළඳසැල පිහිටි ස්ථානය* | *ගේඝාතකාගාරය පිහිටි ස්ථානය* |
|---|---|---|---|
| එළුමස් වෙළඳාම | | | |
| 01. | මොහොමඩ් සුබයිර් මොහොමඩ් මුස්තාක් මහතා අංක 426, නව ඇල්පිටිය, ගෙළිඔය | අංක 49, කළුගමුව පාර, ගෙළිඔය | අංක 426, නව ඇල්පිටිය, ගෙළිඔය. |

04-558

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1713/11 දරන 2011 ජූලි මස 05 දිනැති *ගැසට් පත්‍රයේ* IV(අ) පළාත් සභා නිවේදන යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ, ප්‍රාදේශීය සභා සඳහා පනවන ලද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධන රහිතව, *ගැසට් පත්‍රයේ* පළ වූ දා සිට ක්‍රියාත්මක වන පරිදි, බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උප වගන්තියේ (ව) ඡේදයෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳ ගැනීමට, 2013ක් වූ ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා පැවති මහ සභාවේ තීරණ අංක 06.1.d යටතේ සභා සම්මත කර ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. පී. තුසිත කුලරත්න,
සභාපති,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස,
බුලත්සිංහල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
බුලත්සිංහල.

04-561/1

---

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1713/11 දරන 2011 ජූලි මස 05 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) පළාත් සභා නිවේදන යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ, ප්‍රාදේශීය සභා සඳහා පනවන ලද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධන රහිතව, *ගැසට් පත්‍රයේ* පළ වූ දා සිට ක්‍රියාත්මක වන පරිදි, බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උපවගන්තියේ (ව) ඡේදයෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳ ගැනීමට, 2013ක් වූ ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා පැවති මහ සභාවේ තීරණ අංක 06.1.d යටතේ සභා සම්මත කර ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. පී. තුසිත කුලරත්න,
සභාපති,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස,
බුලත්සිංහල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
බුලත්සිංහල.

04-561/2

---

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24(2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
ප්‍රදේශීය සභාව,
රුවන්වැල්ල.

**උපලේඛනය**

| | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *පාරේ නම* | *පාරේ ආරම්භයේ සිට අවසානය දක්වා* | *පාරේ දිග මීටර්* | *පාරේ පළල මීටර්* | *වම්පස* | | *දකුණු පස* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | *ඉඩම් හිමියන්ගේ නම* | *ඉඩමේ නම* | *ඉඩම් හිමියන්ගේ නම* | *ඉඩමේ නම* |
| 01. | 104 සී දන්නොරුව | හුඹස්වලාන බුළුගහවත්ත පාර | බුළුගහවත්ත සිට අළුත්වත්ත දක්වා | 405.5 | 10 | 1. ඒ. ඩී. විමලසිරි මයා සහ තවත් අය | බුළුගහවත්ත පහළ කැබැල්ල කුඹුර | 1. ඊ. සුගතපාල මයා | බුළුගහවත්ත පහළ කැබල්ල |
| | | | | | | 2. කුමාරතුංග විජේපාල මයා | බුළුගහවත්ත | 2. ඒ. ඩී. විමලසිරි මයා සහ තවත් අය | බුළුගහවත්ත පහළ කැබැල්ල කුඹුර |
| | | | | | | 3. ඩබ්. පියසේන මයා | බුළුගහවත්ත | 3. කුමාරතුංග විජේපාල මයා | බුළුගහවත්ත |
| | | | | | | 4. ඩබ්. විමලසේන මයා | බුළුගහවත්ත | 4. ඩබ්. විමලසේන මයා | බුළුගහවත්ත |
| | | | | | | 5. ඒ. ඩී. විමලසිරි ප්‍රේමරත්න මයා | අළුත්වත්ත | 5. ඒ. ඩී. සරත් ප්‍රේමරත්න මයා | අළුත්වත්ත |
| | | | | | | 6. ඒ. ඩී. ආනන්ද ප්‍රේමරත්න මයා | අළුත්වත්ත | 6. ඒ. ඩී. සමන් ප්‍රේමරත්න මයා | අළුත්වත්ත |
| | | | | | | 7. ඒ. ඩී. සරත් ප්‍රේමරත්න මයා | අළුත්වත්ත | | |
| | | | | | | 8. ඒ. ඩී. සමන් ප්‍රේමරත්න මයා | අළුත්වත්ත | | |
| | | | | | | 9. ඒ. ඩී. සුනිල් ප්‍රේමරත්න මයා | අළුත්වත්ත | | |
| 02. | 101 බී මොරතොට | දන්නොරුව හීන්නේ සිට මොට්ටැව දක්වා මාර්ගය | දන්නොරුව හීන්නේ සිට මොට්ටැව සනි ක්‍රොෆ්ට් වත්ත සීමාව දක්වා | 480 | 10 | 1. එම්. ජිනදාස මයා | කෙහෙල්හේන වත්ත | 1. ජී. ගුණපාල | කෙහෙල් හේන වත්ත |
| | | | | | | 2. ඩී. චන්ද්‍රසේන | කෙහෙල්හේන වත්ත | 2. පී. එම්. අබේරත්න | කෙහෙල් හේන වත්ත |
| | | | | | | 3. පී. එම්. නිශ්ශංක කුමාර මයා | කෙහෙල්හේන | 3. ආර්. ඒ. නවරත්න මයා | කෙහෙල් හේන වත්ත |
| | | | | | | 4 R.M. නවරත්න කුමාර මයා | කෙහෙල්හේන | 4. ආර්.ඒ.එන්. සමන් කුමාර මයා | කෙහෙල් හේන වත්ත |
| | | | | | | 5. එම්. රත්නපාල මයා | කෙහෙල්හේන | 5. ආර්. ඒ. ගුණතිලක මයා | කෙහෙල් හේන වත්ත |
| | | | | | | 6. එම්. ජී. සී. මොරවක මයා | මොට්ටැව | 6. අයි. ජී. ලිලී මිය | මොට්ටැව |
| | | | | | | 7. එම්. ආරියපාල මයා | මොට්ටැව | 7. ආර්. ජී. ජණ්ගා මිය | මොට්ටැව |

04-638

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.